# අග්‍රාමාත්‍ය කාර්යාලය

## අග්‍රාමාත්‍ය කාර්යාලයේ භාවිතයෙන් ඉවත් කරන ලද යකඩ විකිණීම සඳහා මිල ගණන් කැඳවීම

සභාපති
ප්‍රසම්පාදන කමිටුව
අග්‍රාමාත්‍ය කාර්යාලය
අංක 58, සර් අර්නස්ට් ද සිල්වා මාවත
කොළඹ 07

## අග්‍රාමාත්‍ය කාර්යාලයේ භාවිතයෙන් ඉවත් කරන ලද යකඩ විකිණීම සඳහා මිල ගණන් කැඳවීම

1. අග්‍රාමාත්‍ය කාර්යාලයේ භාවිතයෙන් ඉවත් කරන ලද යකඩ දළ වශයෙන් කිලෝ ග්‍රෑම් (Kg) 3,000 ක ප්‍රමාණයක් පවතින අතර එම යකඩ ප්‍රමාණය විකිණීමට සැලසුම් කර ඇත. ඒ අනුව අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් යකඩ කිලෝ ග්‍රෑම් 1 ක් (1 Kg) මිල දී ගැනීම සඳහා උපරිම මිල ඉදිරිපත් කරනු ලබන ලංසුකරු තෝරා ගැනීමට කටයුතු කරනු ලබන අතර, ඉවත් කිරීමට නියමිත සියලු ම යකඩ ප්‍රමාණයන් රැගෙන යායුතු බව සඳහන් කරමි.

2. මිල ගණන් ඉදිරිපත් කිරීමේ දි ආපසු ගෙවනු ලබන රු. 20,000.00 ක මුදල රාජකාරි දිනයන්හි දි අග්‍රාමාත්‍ය කාර්යාලයේ ගිණුම් අංශයේ තැන්පත් කල හැකි අතර අදාළ මුදල් ගෙවූ රිසිට්පතේ පිටපතක් මිල ගණන් සමඟ ඉදිරිපත් කලයුතු බව කාරුණිකව දන්වමි. මුදල් ගෙවීමකින් තොරව ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබයි.  ආපසු ගෙවනු ලබන ඇප තැන්පතුව ටෙන්ඩර් අවසන් වූ දින සිට මසක් ඇතුළත අදාළ රිසිට්පත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ලබා ගත හැකිය.

3. තෝරාගනු ලබන ලංසුකරු විසින් රාජකාරි දින 10 ක් තුළ නියමිත මුළු මුදල ගෙවා යකඩ සම්පූර්ණයෙන් රැගෙන යා යුතුය.

4. මිල දී ගැනීමට උනන්දුවක් දක්වන පාර්ශවයන්හට 2026.04.21 දින පෙ.ව. 10.00 සිට ප.ව. 2.00 දක්වා එම යකඩ පරීක්ෂා කිරීමට අවස්ථාව සලසා දිය හැකි ඇති අතර මේ සම්බන්ධව වැඩිදුර විස්තර කොළඹ 07, අංක 58, සර් අර්නස්ට් ද සිල්වා මාවතේ අග්‍රාමාත්‍ය කාර්යාලයේ ගණකාධිකාරි මගින් ලබා ගත හැක.

5. මුද්‍රා තැබූ ලංසු, ගණකාධිකාරි, අග්‍රාමාත්‍ය කාර්යාලය, අංක 58, සර් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 07 යන ලිපිනයට 2026.04.27 දින ප.ව. 2.00 ට පෙර ලැබීමට සැලැස්විය යුතු ය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කෙරේ. අදාළ භාර ගැනීමේ කාලය අවසන් වූ වහාම ඉහත සඳහන් ලිපිනයේ දී පැමිණි සිටින ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරියේ ලැබී ඇති ලංසු විවෘත කරනු ලැබේ.

6. අදාළ මිල ගණන් ඉදිරිපත් කිරීමට අදාළ අයදුම්පත අග්‍රාමාත්‍ය කාර්යාලයේ නිල වෙබ් අඩවියෙන් (https://www.pmoffice.gov.lk),  විද්‍යුත් ප්‍රසම්පාදන වෙබ් අඩවියෙන් (https://www.promise.lk) හෝ ගිණුම් අංශයෙන් ලබාගත හැක.

දුරකතන / ෆැක්ස් : 011 257 6073 / 011 257 5317-18 දිගුව 182-334

සභාපති
ප්‍රසම්පාදන කමිටුව
අග්‍රාමාත්‍ය කාර්යාලය
අංක 58, සර් අර්නස්ට් ද සිල්වා මාවත
කොළඹ 07

2026.04.08

අංකය [ ]
*(රාජකාරි අවශ්‍යතා සඳහා)*

සභාපති
ප්‍රසම්පාදන කමිටුව
අග්‍රාමාත්‍ය කාර්යාලය
අංක 58, සර් අර්නස්ට් ද සිල්වා මාවත
කොළඹ 07

**<u>අග්‍රාමාත්‍ය කාර්යාලයේ</u>**

**<u>භාවිතයෙන් ඉවත් කරන ලද යකඩ මිල දී ගැනීම සඳහා වන ටෙන්ඩර් පත්‍රය</u>**

| විස්තරය | මිල දී ගනු ලබන මිල | |
|---|---|---|
| | රුපියල් | ශත |
| යකඩ 1 Kg ක් සඳහා | | |

මිල දී ගනු ලබන යකඩ 1 Kg ක මිල රුපියල් *(අකුරින්)* ………………………………………………… සහ සත ……………………………… ක් පමණි.

- ආපසු ගෙවනු ලබන රු.20,0000 ක ඇප තැන්පතු මුදල සඳහා වූ කුවිතාන්සි අංක …....……..…….. දිනය 2026.04...…
- මිල දි ගැනීමට තෝරාගත් පසු මිල දී ගැනීමට අසමත් වුවහොත් එම ඇප තැන්පතුව රාජ සන්තක කිරීමට කටයුතු කරනු ලබන බව දනිමි.

මිල ගණන් ඉදිරිපත් කරන තැනැත්තාගේ සම්පූර්ණ නම :

…………………………………………………………………………………………………

ස්ථිර ලිපිනය:

…………………………………………………………………………………………………

…………………………………………………………………………………………………

දුරකථන අංකය [ | | | | | | | | | ]

ජාතික හැඳුනුම්පත් අංකය [ | | | | | | | | | | | ]

මා විසින් ඉහත සඳහන් කරන ලද සියලු කරුණු සත්‍ය හා නිවැරදි බවත්, මෙම ඉල්ලුම් පත්‍රයේ සහ මෙයට අදාළ සියලු කොන්දේසිවලට එකඟ වන බවත්, මේ සම්බන්ධයෙන් වන අවසන් තීරණය අග්‍රාමාත්‍ය කාර්යාලයීය ප්‍රසම්පාදන කමිටුවේ තීරණය වන බවත්, එය පිළිගනු ලැබීමට බැඳී සිටින බවත්, ඒ සඳහා මා තෝරා ගනු ලැබුවහොත්, ඒ බැව් දන්වා එවූ දින සිට රාජකාරි දින 10 ක් තුළ මුදල් ගෙවා අදාළ යකඩ ඉවත් කරගෙන යාමට මෙයින් පොරොන්දු වන බවත් ප්‍රකාශ කරමි.

අත්සන : ………………………………….      දිනය : ……………………….

නිල මුද්‍රාව *(ඇත්නම්)* : ………………………….